සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023

# බුද්ධ ධර්මය

**කාලය පැය 02 යි**

නම / විභාග අංකයඃ ..........................................................................................

සැලකිය යුතුයි,

- ❖ පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 2 බැගින් හිමි වේ.
- ❖ දෙවන කොටසේ පළමු ප්‍රශ්නය අතුළුව ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.

---

- 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

**01.** "අභිධර්මය මෙනෙහි කරමින් සිටි අවස්ථාවේ බුද්ධ ශරීරයෙන් බුදු රැස් විහිදෙන්නට පටන් ගත්තේය." මෙම සිදුවීම සිදු වූයේ,

(1) පළමු සතියේ ය. (2) දෙවන සතියේ ය.
(3) තෙවන සතියේ ය. (4) සිව්වන සතියේ ය.

**02.** බරණැස් සිටුතුමාගේ පුත්‍රයා ........................ නම් වේ,

(1) යස. (2) විමල.
(3) පුණ්ණජි. (4) ගවම්පති.

**03.** උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග ගණන කීයද?

(1) 8 කි. (2) 5 කි.
(3) 4 කි. (4) 6 කි.

**04.** බුදු පියාණන් වහන්සේ සියලු කෙලෙස් බිඳ දමා නිවනට ගමන් කළ හෙයින්ද යහපත් ගමන් ඇති හෙයින් හා සුන්දර වචන ප්‍රකාශ කරන හෙයින්,

(1) ලෝක විදූ නම් විය. (2) සම්මා සම්බුද්ධ නම් විය.
(3) සුගත නම් විය. (4) අනුත්තර පුරිසධම්ම සාරතී නම් විය.

**05.** කාව්‍යශේඛරය රචනා කරන ලද්දේ,

(1) බලංගොඩ ආනන්ද මෛත්‍රිය හිමි. (2) වීදාගම මෛත්‍රිය හිමි.
(3) වැත්තැවේ හිමි. (4) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

- 6 – 10 දක්වා ප්‍රශ්න හොඳින් කියවා හරි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.

**06.** මංගල, රතන හා කරණීය මෙත්ත යන සූත්‍ර තුන් සූත්‍රයට අයත් වේ. ( )

**07.** භාවනාවේදී පුරුෂ පාර්ශවය වාඩි වන්නේ අර්ධ පර්යංකයෙන්ය. ( )

**08.** අනේ පිඬු සිටුතුමා ජේතවනාරාමය සෑදවීමට කහවනු දහඅට කෝටියක් වැය කොට තිබේ. ( )

**09.** පති කුලයට ගිය විශාකාව මිගාර මාතා නමින් ප්‍රසිද්ධ විය. ( )

**10.** ගිම්හානය යනු වැසි වැටෙන සමයයි. ( )

- 11 සිට 15 දක්වා ප්‍රශ්න හොඳින් කියවා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

**11.** ........................................... යනු බුදුදහම උඩුගම් බලා යාමට මගපෙන්වන්නකි.

**12.** කුසලයෙහි නිරත වීම .......................................... යි.

**13.** සිල් සමාධි ප්‍රඥා යනු ......................................යි.

**14.** අස්වැන්නේ පළමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීම ...................................... දානය වේ.

**15.** ....................................... නදිය පංච මහා ගංගාවන්ගෙන් එකකි.

(සමාදානය , ත්‍රි ශික්ෂාව , පටිසෝතගාමී , අග්‍රශෂ්‍ය , අචිරවතී , ත්‍රිලක්ෂණය)

- 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| | | |
|---|---|---|
| **16.** | ජේතවනාරාමය ඉදිකිරීම බිම්කඩ ලබා දුන්නේ | අග්ගබීජයයි |
| **17.** | සැප දුක ලබා දෙන නියමයන් 5කි | අත්තකිලමතානුයෝගය |
| **18.** | දල්ලෙන් පැළවෙන්නේ | ධම්මානුපස්සනාව |
| **19.** | තමා විසින් තමාට අසීමිත ලෙස දුක් දීම | ජේත කුමරු |
| **20.** | ධර්ම හා ධර්ම ස්වභාවය පිළිබඳ මනා සිහිය පවත්වා ගැනීම | පංච නියාම ධර්ම |

# II කොටස

❖ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

**01.** පිළිතුරු සපයන්න.

I. රහසත් පව් නොකොට - කෙලෙසරයනුත් දුරු කොට
........................................... මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
II. සිරිත් මල්දම කෘතිය රචනා කරන ලද්දේ කවුද?
III. පන්සලේදී සිදු කරන වතාවත් 2ක් ලියන්න.
IV. සිරිත් විරිත් යන වචන දෙකෙහි අරුත් දක්වන්න.
V. දස පුණ්‍යක්‍රියා වලින් 2ක් ලියන්න.
VI. සමජීවිකථාවට පටහැනි වූ පරිභෝජන ක්‍රම 2 ක ලියන්න.
VII. සතර බ්‍රහ්ම විහරණ වලින් 2ක් ලියන්න.
VIII. මිහිඳු මහරහතන් වහන්සේ සමඟ ලක්දිවට පැමිණි පිරිසෙන් දෙදෙනෙකුගේ නම් ලියන්න.
IX. අත සෝදනවා , වතුර බොනවා යන වචන වෙනුවට ශාසනික වචන ලියන්න.
X. අත්තූපනායක ධර්මය යන්න කෙටියෙන් හඳුන්වන්න.

**02.** I. චතුරාර්ය සත්‍ය අතරින් 2ක් නම් කරන්න.
II. ඉන් 1ක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.
III. චතුරාර්ය සත්‍ය ඉගෙනීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන 05ක් ලියන්න.

**03.** I. මහින්දාගමනය යන්න කෙටියෙන් පහදන්න.
II. මහින්දාගමනයෙන් ලත් දායාද 04 ක් නම් කරන්න.
III. මහින්දාගමනය නිසා ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස වෙනස් වූ අයුරු පැහැදිලි කරන්න.

**04.** I. බුදුන් වහන්සේගේ අසරණ සරණ ගුණය ප්‍රකට වන කථා පුවත් 2ක් නම් කරන්න.
II. ඉන් එක් පුවතක් කෙටියෙන් ලියන්න.
III. අසරණයන්ට පිහිට වීමෙන් වීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 05ක් ලියන්න.

**05.** I. ඉවසීම යනු කුමක්ද?
II. සැරියුත් හිමිගේ චරිතයෙන් ඉවසීමේ ගුණය ප්‍රකට වන අවස්ථාවක් කෙටියෙන් ලියන්න.
III. ඉවසීමෙන් ලැබෙන ආනිශංස ධර්ම 5 ලියන්න.

**06.** I. වෛරය සන්සිඳෙන ආකාරය දක්වමින් දේශනා කර ඇති ධම්ම පද ගාථාව ලියන්න.
II. එහි තේරුම ලියන්න.
III. මෛත්‍රී සහගතව කටයුතු කිරීමෙන් වෛරය සන්සිඳෙන ආකාරය දක්වන්න.

**07.** I. ගිහියාගේ නිත්‍ය ශීලය හැඳින්වීමට යොදන වෙනත් නම් 2ක් ලියන්න.
II. වචනයෙන් සිදුවන වැරදි 04ක් ලියන්න.
III. සුරාමේරය මජ්ජ පමා දට්ඨානා යන සිල් පදයෙන් සමාජයට සිදුවන අයහපත ලියන්න.

**08.** මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

I. කාව්‍යශේඛරය
II. නියාම ධර්ම
III. සමජීවිකථා
IV. විශාකා සිටු කුමාරිය